**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අදියර III විභාගය - ජූලි 2022

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

---

(303) මූල්‍ය පාලනයන් සහ විගණනය ප්‍රශ්න පත්‍රය අනිවාර්ය ප්‍රශ්න 9 කින් සමන්විත වේ. ප්‍රශ්න පත්‍රය කොටස් 3 කින් සමන්විත විය. එකකට ලකුණු 5 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න 4ක් **A කොටසට** අඩංගු විය. එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න 3 ක් **B කොටස** අඩංගු විය. **C කොටස** එකකට ලකුණු 25 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න 2 ක් අඩංගු විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය සියලුම ප්‍රශ්නවලට උත්තර ලියා තිබුණි. කෙසේවෙතත් ප්‍රශ්නවල සමහර කොටස් සඳහා උත්තර ලියා නොතිබුණි. මෙය සිදුවී ඇත්තේ ප්‍රධාන වශයෙන් දුර්වල කාල කළමණාකරණය, දැනුම නොමැති වීම සහ ප්‍රශ්නයෙන් අවශ්‍ය කර තිබූ දේ අවබෝධ කර නොගෙන තිබීම නිසාය.

**සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක තිබුණේය.**

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය පදනම් වී ඇත්තේ ව්‍යාපාරික පරිසරය පිළිබඳ දැනුම මත වන අතර එළවළු වගා කිරීම සහ විකිණීමේ නිරත **සීමාසහිත ඇග්‍රෝ ලයිෆ් (පෞද්ගලික) සමාගමෙහි** ව්‍යාපාරික කටයුතුවලට පරිසර සාධක ඇති කරන බලපෑම තක්සේරු කිරීම මතයි. සියලුම අපේක්ෂකයින් පාහේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර ඇති අතර බොහෝ අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගත්හ. කෙසේ වෙතත්, අපේක්ෂකයින් සුළු පිරිසක් අනවශ්‍ය ලෙස දිර්ඝ ලෙස විස්තර කිරීමට යාමෙන් කාලය නාස්ති කරගෙන තිබුණි.

සතුටුදායක අන්දමට ලකුණු ලබා ගැනීම සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍ර පිළිබඳව සාධාරණ දැනුමක් ලබා ගැනීමට අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

- ව්‍යාපාරික පරිසරය - අභ්‍යන්තර, බාහිර
- අභ්‍යන්තර සහ බාහිර පරිසරයේ බලවේග - සම්පත් සහ හැකියාවන්
- PESTEL සාධක - දේශපාලනික (දේශපාලන ස්ථාවරත්වය, බදු ප්‍රතිපත්ති), ආර්ථික (උද්ධමනය, පොලී අනුපාතිකය, විනිමය අනුපාතිකය), සමාජීය, තාක්ෂණික සහ පාරිසරික, නීතිමය

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 02

ප්‍රශ්නයේ **(a) කොටස** අවදානම් කළමනාකරණ ආකෘතිමය රාමුව භාවිතා කිරීමෙන් ලැබෙන අවස්ථා / ප්‍රතිලාභ තුනක් සඳහන් කිරීමට අවශ්‍ය විය. ස්ව අධ්‍යයන පාඨමාලා ග්‍රන්ථයේ අවස්ථා පහක් සවිස්තරාත්මකව පැහැදිලි කිරීම් සහිතව සඳහන් කර ඇත.

කෙසේ වෙතත්, කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමේ පැවති අතර බොහෝ අයදුම්කරුවන් පහත සඳහන් පරිදි අදාළ නොවන පිළිතුරු සපයා ඇත.

- විගණන මතය ප්‍රකාශ කිරීමට පහසුකම් සැලසීම
- අවදානම අඩු කිරීම, බෙදාගැනීම, මාරු කිරීම කළ හැක
- ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරුව

**(b) කොටස** තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අවදානම් කළමනාකරණ මෙවලම් දෙකක් හඳුනා ගැනීමට අපේක්ෂා කර ඇත. කාර්ය සාධනය සතුටුදායක මට්ටමක නොතිබූ අතර බොහෝ සිසුන් අවදානම් තක්සේරුව, නිරීක්ෂණ සහ සමාලෝචනය, CCTV, ඇඟිලි සලකුණු, මුරපදය වැනි අදාළ නොවන පිළිතුරු සපයා ඇත.

ඉහළ ලකුණු ලබා ගැනීම සඳහා අපේක්ෂකයින් පහත සඳහන් විෂය ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කළ යුතුය.

- බාහිර හා අභ්‍යන්තර අවදානම්
- අවදානම් අවම කිරීමේ ශිල්පීය ක්‍රම සහ අවදානම් කළමනාකරණ මෙවලම්
- අවදානම් කළමනාකරණයේ ප්‍රතිලාභ සහ අවදානම් කළමනාකරණ ආකෘතිමය රාමුව භාවිතා කිරීමේ අවදානම

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 03

ප්‍රශ්නය මුළුමනින්ම පදනම් වී ඇත්තේ සහතිකවීමේ කාර්යභාරයන් මතය. **(a) කොටසෙදී** "සහතිකවීමේ කාර්යභාරය" යන පදය නිර්වචනය කිරීම අවශ්‍ය වූ අතර **(b) කොටසෙදී** ලබාදුන් සිද්ධිය මත පදනම්ව සහතිකවීමේ කාර්යභාරයක ප්‍රධාන සංරචක තුනක් (03) හඳුනා ගැනීමට අවශ්‍ය විය.

ප්‍රශ්නය සඳහා සෘජු පිළිතුරක් දිය හැකිව තිබුණි.

බොහෝ අයදුම්කරුවන්ට සහතිකවීමේ කාර්යභාරයන් සහ එහි ප්‍රධාන සංරචක පිළිබඳව දළ අදහසක් තිබූ බැවින් කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමේ පැවතුණි. කෙසේ වෙතත්, අදාළ විෂය කරුණු පිළිබඳ අවබෝධය අඩු වීම නිසා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

එබැවින්, සහතිකවීමේ කාර්යභාරය නිර්වචනය කිරීමේදී, බොහෝ අපේක්ෂකයින් පහත සඳහන් ප්‍රධාන වචන සඳහන් කර නොතිබුණි:

- වෘත්තිකයා
- ප්‍රමාණවත් සුදුසු සාක්ෂි
- නිගමනයක් ප්‍රකාශ කිරීම
- විශ්වාසය වැඩි දියුණු කිරීම
- අපේක්ෂිත පරිශීලකයා
- විෂය කරුණු
- යම් නිර්ණායක

අයදුම්කරුවන්ට සෑහීමකට පත්වන ලකුණක් ලබා ගැනීම සඳහා සහතිකවීමේ කාර්යභාරයන් වලට අදාළ සියලුම තාක්ෂණික වචන කෙරෙහි සාධාරණ අවබෝධයක් ඇතිව අවධානය යොමු කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයේ කොටස් දෙකම උත්සාහ කර ඇති අතර **(a) කොටසට** සාපේක්ෂව **(b) කොටස** සඳහා සැලකිය යුතු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්හ. කෙසේ වෙතත්, වැඩි අපේක්ෂකයින් පිරිසක් ව්‍යවස්ථාපිත විගණනය පිළිබඳ විස්තර කිරීමට යාමෙන් ලකුණු අහිමි විය.

**(b) කොටසේ** දී ලබා දී ඇති සිද්ධිය යටතේ ඇති සංරචක නිවැරදිව හඳුනාගෙන සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි විය.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුනි.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය විගණන ආයතනයක තත්ත්ව පාලන ක්‍රියාපටිපාටින් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. **(a) කොටස** මගින් විගණන ආයතනයක් විසින් සේවාදායක සබඳතා පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාමේදී ක්‍රියාත්මක කළ යුතු අවශ්‍යතාවයන් දෙකක් (02) සහ **(b) කොටස** මගින් අධීක්ෂණය යටතේ ඇතුළත් විය යුතු ක්‍රියාකාරකම් දෙකක් (02) විමසා ඇත. මෙය ඉතා නිශ්චිත න්‍යායාත්මක ප්‍රශ්නයකි.

කාර්යසාධනය ඉතා දුර්වල විය. අයදුම්කරුවන් පහත දක්වා ඇති අදාළ නොවන පිළිතුරු සඳහන් කර තිබුණි.

- ගිවිස ගැනීමේ ලිපිය නිකුත් කිරීම
- ගාස්තු සහ බිල්පත් සැකසීම
- ලේඛනගත කිරීම

**(b) කොටස** මඟින් අධීක්ෂණය යටතේ ඇතුළත් විය යුතු ක්‍රියාකාරකම් විමසා ඇත. කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. අයදුම්කරුවන් පහත දක්වා ඇති අදාළ නොවන පිළිතුරු සඳහන් කර තිබුණි.

- නිරීක්ෂණය
- අවදානම් තක්සේරුව
- දෛනික ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම
- අධීක්ෂණය, සමාලෝචනය

අපේක්ෂකයින් පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කර ගත යුතුය.

- තත්ත්ව පාලන සමාලෝචනයේ අරමුණු, සංරචක සහ වැදගත්කම.
- ස්වාධීනත්වය
- මූල්‍ය ප්‍රකාශන විගණනයක් සඳහා අදාළ වන තත්ත්ව පාලන අවශ්‍යතාවය
- සේවාදායක සබඳතා පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සහ විගණන සම්බන්ධතාව සහ විගණන කාර්යභාරයන්

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි.**

## B කොටස

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය කොටස් 3 කින් සමන්විත වූ අතර **(a) කොටස** මගින් "විගණන සාක්ෂිවල ප්‍රමාණවත් බව සහ යෝග්‍යතාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද" යන්න පැහැදිලි කිරීම අවශ්‍ය විය. කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමේ විය. සමහර අපේක්ෂකයින් විගණන සාක්ෂිවල ප්‍රමාණවත්බව විගණන සාක්ෂි ප්‍රමාණය මනින බවත් යෝග්‍ය බව විගණන සාක්ෂිවල ගුණාත්මකභාවයට සම්බන්ධ බව පැහැදිලි කිරීමකින් තොරව ලිවීම හේතුවෙන් සම්පූර්ණ ලකුණු ලබා නොගත්හ. සමහර අයදුම්කරුවන් සත්‍ය සහ සාධාරණ මූල්‍ය තොරතුරු, සාක්ෂි නොමැති ප්‍රමාණාත්මක අවප්‍රකාශන යනාදී සාමාන්‍ය පිළිතුරු සැපයීම හේතුවෙන් ලකුණු ලබාගෙන නොමැත.

**(b) කොටස,** ප්‍රමාණාත්මක අවප්‍රකාශන ඇතිවීමේ අවධානම සහ යෝග්‍ය විගණන සාක්ෂි අතර සම්බන්ධතාවය පැහැදිලි කරන ලෙස ඉල්ලා ඇත. ඉතා සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණක් සතුටුදායක ලෙස පැහැදිලි කිරීම් කර සම්පූර්ණ ලකුණු ලබා ගත්හ.

**(c) කොටස,** සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් විගණන කණ්ඩායම විසින් සිදු කළ හැකි විගණන පටිපාටි හතරක් හඳුනා ගැනීම අවශ්‍ය විය. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා අඩු වූ අතර සාමාන්‍ය අපේක්ෂකයින් සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රමාණයක් පහත දැක්වෙන සාමාන්‍ය විගණන ක්‍රියාපටිපාටි සඳහන් කිරීම නිසා ලකුණු ගැනීමට නොහැකි විය.

- විමසීම
- පරීක්ෂා කිරීම
- නිරීක්ෂණය
- නැවත ගණනය කිරීම

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය කොටස් 3 කින් සමන්විත වූ අතර විගණන වාර්තාවේ මූලිකාංග, කරුණක් අවධාරණය කිරීමේ ඡේදය සහ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි ඔහු විසින් අහිතකර මතයක් ප්‍රකාශ කරන අවස්ථා සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කරන ලදී.

**(a) කොටස** විගණන වාර්තාවේ මූලිකාංග හතරක් සඳහන් කිරීමට අවශ්‍ය විය. මෙය ඉතා පහසු ප්‍රශ්නයක් වූ අතර අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සම්පූර්ණ ලකුණු ලබා ගත්හ.

සමහර අයදුම්කරුවන් පහත සඳහන් අදාළ නොවන පිළිතුරු සඳහන් කර අඩු ලකුණු ලබා ගෙන තිබුණි.

- විගණන සාක්ෂි
- වැඩ පත්‍රිකා සමාලෝචන දිනය
- සාමාන්‍ය පොතක හෝ වාර්තාවක අන්තර්ගතය

**(b) කොටස** මගින්**,** "විගණන වාර්තාවේ අන්තර්ගත කර ඇති කරුණක් අවධාරණය කිරීමේ ඡේදය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද" යන්න පැහැදිලි කිරීමට අවශ්‍ය කර තිබුණි. කාර්ය සාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. බොහෝ අපේක්ෂකයින් සඳහන් කර තිබුණේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විට කරුණක් අවධාරණය කිරීමේ ඡේදය ඇතුළත් වන බවයි.

**(c) කොටස,** මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි ඔහු විසින් අහිතකර මතයක් ප්‍රකාශ කරන අවස්ථාවක් පැහැදිලි කිරීමට අවශ්‍ය කර තිබුණි. කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. බොහෝ අපේක්ෂකයින් ප්‍රමාණාත්මක අවප්‍රකාශන පිළිබඳ සඳහන් කර ඇති නමුත් ඉතා සුළු පිරිසක් මූල්‍ය ප්‍රකාශනවල පැතිරීම ගැන සලකා ඇත.

පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කර ගැනීමට අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ:

- විගණන වාර්තාවක මූලිකාංග.
- විගණන මත වර්ග (විකරණය කළ, විකරණය නොකළ, තත්ත්වාගණනය කළ, අහිතකර මතය**,** ව්‍යාවනය කළ මතය).
- කරුණක් අවධාරණය කිරීමේ ඡේදය සහ අනෙකුත් ඡේද අවධාරණය කිරීම.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයේ **(a) කොටසේදී,** ප්‍රශ්නයේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් මූලික ආචාරධර්ම මූලධර්මවලට අනුකූලවීමේ තර්ජන තුනක් තක්සේරු කිරීමට අවශ්‍ය විය. කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමේ විය. බොහෝ අයදුම්කරුවන් ආචාරධර්ම මූලධර්ම වෙනුවට ස්වාධීනත්වයට අනුකූල වීමේ තර්ජන ගැන සඳහන් කර ඇත. ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නයේ සඳහන් කරුණු සමග තක්සේරුවකින් තොරව තර්ජන ප්‍රකාශ කර තිබිණි.

ප්‍රශ්නයේ **(b) කොටස** ස්ථාපිත කළ යුතු ආයතනික මට්ටමේ ආරක්ෂණ ක්‍රම හතරක් සඳහන් කිරීමට අවශ්‍ය විය. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා අඩු වූ අතර සමහර අයදුම්කරුවන් ආයතනික මට්ටමේ ආරක්ෂාවට වඩා නියැලීමේ විශේෂිත ආරක්ෂාව සඳහන් කර ඇත.

සදාචාරාත්මක අවශ්‍යතා සඳහා 10% ක බර තැබීමක් තබා ඇති අතර සතුටුදායක ලකුණු ලබා ගැනීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- සදාචාරාත්මක හැසිරීම් වල වැදගත්කම
- වෘත්තීය ආචාර ධර්මවල මූලික මූලධර්ම
- ස්වාධීනත්වය සහ සදාචාරාත්මක අවශ්‍යතා සඳහා තර්ජන
- ආයතනික මට්ටමේ සහ නියැලීමට විශේෂිත ආරක්ෂණ.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුනි.**

## C කොටස

## ප්‍රශ්න අංක 08

### A කොටස

**(a)** **සීමාසහිත කුවුන් (පෞද්ගලික) සමාගමේ** සමස්ත විගණන උපායමාර්ගය පිළියෙළ කිරීමේදී සලකා බැලිය යුතු කරුණු හඳුනා ගැනීමට මෙම ප්‍රශ්නයේදී අවශ්‍ය වුවද, අයදුම්කරුවන් බහුතරයක් සැහැල්ලුවෙන් පිළිතුරු ලබා දීම සහ එය ප්‍රශ්නයේ දක්වා ඇති තොරතුරු සමග නොගැලපීම හේතුවෙන් මුළු ලකුණු ලබා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවිය. සියලුම උදාහරණ ප්‍රශ්නයේම අන්තර්ගත වුවද ඇතැම් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිසි පිළිතුරු ලබා දී නොමැත. තවද, ඇතැම් අයදුම්කරුවන්ට විගණන උපායමාර්ගයේ අර්ථය සහ විගණනය ආරම්භක අදියරේදී එය අදාළ වන ආකාරය පිළිබඳව ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොතිබුණි. ලකුණු අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ ප්‍රශ්නය කියවීමට අවධානය යොමු නොකිරීමයි.

**(b)** කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමේ විය. දුර්වල ලකුණු සඳහා හේතු වූයේ ජංගම විගණන ලිපි ගොනුව සහ ස්ථාවර විගණන ලිපි ගොනුව පවත්වාගෙන යාමේ අරමුණු පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම දුර්වල වීමයි. සමහර අපේක්ෂකයින් ස්ථාවර විගණන ලිපි ගොනුවට වඩා ජංගම විගණන ලිපි ගොනුවේ ඇතුළත් ලේඛන ලැයිස්තුගත කර ඇත.

උදා: ගෙවීම් වවුචර, ඉන්වොයිසි, මූල්‍ය ප්‍රකාශන

**(c)** ප්‍රශ්නයේ මෙම කොටස විගණකයෙකුට ප්‍රමාණාත්මභාවය වැදගත් වීමට හේතු හතරක් සඳහන් කිරීමට අවශ්‍ය විය. මෙය ඍජු ප්‍රශ්නයක් වන අතර ඍජු පිළිතුරු දිය හැකිව තිබුණි. කෙසේවෙතත්, කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමේ විය.

සමහර අයදුම්කරුවන් පහත සඳහන් අදාළ නොවන පිළිතුරු සපයා තිබූ අතර ලකුණු ලබාගෙන නොමැත:

- වැරදි නිවැරදි කිරීම
- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම

**(d)** මෙම කොටසේදී විගණනයට අදාළව ඔබ විසින් ලබාගත හැකි ලිඛිත නියෝජනයන් හතරක් හඳුනා ගැනීමට අවශ්‍ය විය. කාර්ය සාධනය දුර්වල විය. හේතුව වුයේ පරීක්ෂා කළ ක්ෂේත්‍ර පිළිබඳ අයදුම්කරුවන්ගේ තාක්ෂණික දැනුම දුර්වල වීමයි. බොහෝ අපේක්ෂකයින් සේවයේ යෙදවීමේ ලිපිය, විගණන වාර්තාව, මුදල් ප්‍රවාහ යනාදී සම්පූර්ණයෙන්ම අදාළ නොවන පිළිතුරු ලියා තිබුණි.

**<u>B කොටස</u>**

**(a)** අභ්‍යන්තර පාලනයන්ගේ දුර්වලතාවයන් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කිරීමට මෙම ප්‍රශ්නයේදී අවශ්‍ය විය. අපේක්ෂකයින්ගෙන් බහුතරයක් මෙම කොටස උත්සාහ කර ඇති අතර පරිපූර්ණ පිළිතුරක් ලබා දුන්නේ ඉතා සුළු අපේක්ෂකයින් පිරිසක් පමණි. බොහෝ අපේක්ෂකයින් අභ්‍යන්තර පාලනය පිළිබඳ සාමාන්‍ය අවබෝධය මත පිළිතුරු ලබා දී තිබුණි. එබැවින්, සුදුසු තාක්ෂණික වචන සමඟ අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කර ගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**(b)** ප්‍රශ්නයේ දක්වා ඇති තොරතුරු මත පදනම්ව කුවුන් හි අභ්‍යන්තර පාලනයන්ගේ ඌනතාවයන්ගේ බලපෑම තක්සේරු කිරීමට මෙම කොටසෙදී අවශ්‍ය විය. අපේක්ෂකයින්ගෙන් බහුතරයක් අභ්‍යන්තර පාලනවල ඌනතාවයන් හඳුනාගෙන තිබුණද, ඒවායේ බලපෑම තක්සේරු කිරීමට නොහැකි විය. සැබෑ ව්‍යාපාරික පරිසරය තුළ තම න්‍යායික දැනුම භාවිත කිරීමට අපේක්ෂකයාට ඇති නොහැකියාව එයින් පෙන්නුම් කෙරිණි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුනි.**

## ප්‍රශ්න අංක 09

**<u>A කොටස</u>**

**(a)** ලබා දී ඇති කරුණු මත ජාලිය බතික් හි දුර්වල යැයි පෙන්නුම් කෙරෙන COSO ආකෘති රාමුවට අනුව අභ්‍යන්තර පාලන පද්ධතියෙහි මූලිකාංග හඳුනා ගැනීමට අවශ්‍ය විය. කාර්ය සාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. බොහෝ අයදුම්කරුවන් අභ්‍යන්තර පාලන පද්ධතියෙහි මූලිකාංග හඳුනාගෙන තිබූ නමුත් ප්‍රශ්නයේ දක්වා ඇති කරුණු සමඟ සම්බන්ධ කිරීමට නොහැකි විය. අයදුම්කරුවන් පසුගිය ප්‍රශ්න පත්‍ර කිහිපයක් පුහුණු වී තිබුනේනම් මෙවැනි ප්‍රශ්න සඳහා වැඩි ලකුණු ලබා ගැනීමට හැකියාව තිබුණි.

**(b)** මෙම කොටසේදී ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් වැදගත් වීමට හේතු පැහැදිලි කිරීමට අවශ්‍ය විය. මෙයද, ඍජු ප්‍රශ්නයක් වන අතර අයදුම්කරුවන් විසින් අදාළ ස්ව-අධ්‍යයන පොත් කට්ටලය අධ්‍යයනය කිරීමට සාධාරණ සැලකිල්ලක් දැක්වූයේ නම්, එහි අභ්‍යන්තර පාලන පද්ධතියේ වැදගත්කම මනාව පැහැදිලි කළ හැකිව තිබුණි. මෙම කොටස සඳහා කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවති අතර ස්ව-අධ්‍යයන පොත සඳහා නිසි අවධානයක් යොමු කරන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**(c)** අභ්‍යන්තර පාලන පද්ධතියක ආවේනික සීමාවන් දෙකක් හඳුනා ගැනීම මෙම කොටසේදී අවශ්‍ය විය. කාර්යසාධනය සාමාන්‍ය මට්ටමේ විය. සමහර අයදුම්කරුවන් සාමාන්‍ය පිළිතුරු සැපයූ අතර සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

**B කොටස**

**(a) සහ (b) කොටස**

**(a) කොටසෙදී** ජාලිය බතික් හි මුදල් කළමනාකරණ ක්‍රියාවලිය තුළ පවතින අභ්‍යන්තර පාලන දුර්වලතාවයන් පහක් හඳුනා ගැනීමට අවශ්‍ය වූ අතර **(b) කොටසේදී** ඉහත දුර්වලතා මඟහරවා ගැනීම සඳහා නිර්දේශ සඳහන් කිරීමට අවශ්‍ය වූ අතර කාර්යසාධනය සතුටුදායක මට්ටමක තිබුණි.

ඇතැම් අයදුම්කරුවන් අභ්‍යන්තර පාලන දුර්වලතා හඳුනා නොගෙන ප්‍රශ්නයේ දී ඇති තොරතුරු නැවත නැවත සඳහන් කර තිබූ අතර ඇතැම් අයදුම්කරුවන් අදාළ දුර්වලතා හඳුනා නොගෙන නිර්දේශ ලබා දී තිබුණි.

මෙම වර්ගයේ ප්‍රශ්නයකට අපේක්ෂකයින් සතුටුදායක ලකුණු ලබා ගැනීම සඳහා:

- ප්‍රශ්නය අවම වශයෙන් දෙවරක්වත් කියවිය යුතුය.
- ඔවුන්ගේ දැනුම භාවිතා කරමින් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රධාන ගැටළු සහ ප්‍රමුඛතා ගැටළු හඳුනා ගැනීම.
- හඳුනාගත් ගැටළු විසඳීම සඳහා වලංගු නිර්දේශ ඉදිරිපත් කිරීම.

**(c)** තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේදී සලකා බැලිය හැකි පොදු තොරතුරු තාක්ෂණ පාලන සහ එක් එක් පාලනය සඳහා උදාහරණයක් ලැයිස්තුගත කිරීමට මෙම කොටසෙදී අවශ්‍ය විය. කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමේ විය.

බොහෝ අපේක්ෂකයින් තොරතුරු තාක්ෂණ පාලනයන් පිළිබඳ දුර්වල අවබෝධය හේතුවෙන් පැහැදිලිවම පාලනයන් සහ උදාහරණ හඳුනාගෙන නොතිබුණි.

**මෙම ප්‍රශ්නයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුනි.**

\- - -

**<u>විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා</u>:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් විභාගවල ප්‍රශ්නවලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මගින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නඟා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

\- * * * -